ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

සමාජ අධ්‍යයන අංශය

සමාජ විද්‍යා පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2024/2025

1 වන මට්ටම - 2 වන වර්ෂාර්ධය

අවසාන පරීක්ෂණය

DSC1813 - කළමනාකරණය හැඳින්වීම

කාලය: පැය 3 ක් පමණි.

දිනය: 02.08.2025 වේලාව: පෙ.ව.09.30 - ප.ව.12.30

උපදෙස්:

- ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සමන්විත වේ
- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.
- පිළිතුරු පැහැදිලිව ලිවිය යුතුය.

ප්‍රශ්න අංක 1.

වර්තමාන ව්‍යාපාර ලෝකය තුළ කළමනාකරණය වැදගත් වන්නේ ඇයි? උදාහරණ දක්වන්න.

(ලකුණු 20)

ප්‍රශ්න අංක 2.

(අ) ධනාත්මක පරිසරය නිර්වචනය කර එහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) ධනාත්මක වැඩ පරිසරයක මානව සම්බන්ධතා මානය වැදගත් කොටසක් යැයි ඔබ සිතන්නේ ඇයි? (ලකුණු 10)

ප්‍රශ්න අංක 3.

(අ) සංවිධානයක් තුළ කළමනාකරුවෙකුගේ කාර්යයන් මොනවාද? (ලකුණු 10)

(ආ) ඵලදායී කළමනාකරුවෙකු ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා විස්තර කරන්න.

(ලකුණු 10)

ප්‍රශ්න අංක 4.

(අ) සැලසුම්කරණය නිර්වචනය කර සංවිධානයකට සැලසුම් කිරීමෙන් ඇතිවන ධනාත්මක බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) ගැටුම් කළමනාකරණයේ විවිධ ක්‍රම විස්තර කොට ඒ එක් එක් ක්‍රමය ඵලදායී වන අවස්ථා පහදන්න. (ලකුණු 10)

ප්‍රශ්න අංක 5.

නායකත්වය යනු සංවිධානාත්මක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මිනිසුන්ට බලපෑම් කිරීමේ හැකියාවයි.

(අ) නායකයකුගේ ප්‍රධාන කාර්යයන් මොනවාද? (ලකුණු 10)

(ආ) නායකයකු සතු විය හැකි බල වර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

ප්‍රශ්න අංක 6.

(අ) කළමනාකරණ සන්නිවේදනය නිර්වචනය කර සන්නිවේදනයේ ඇති ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) සන්නිවේදනය යනු ව්‍යවසායේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ඵලදායී කළමනාකරණ මෙවලමකි. අදහස් දක්වන්න. (ලකුණු 10)

ප්‍රශ්න අංක 7.

(අ) කළමනාකරණය තුල සම්බන්ධීකරණය පිළිබඳ මූලික සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සම්බන්ධීකරණයේ විවිධ වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ප්‍රශ්න අංක 8.

(අ) ඵලදායී කළමනාකරණ පාලන පද්ධතියක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) පාලන ප්‍රමිතීන් පිළිබඳ ප්‍රධාන අදහස් මොනවාද? (ලකුණු 10)

ප්‍රශ්න අංක 9.

පහත දැක්වෙන ඕනෑම 4ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) නායකත්වය
(ආ) න්‍යාස සංවිධානය (Matrix organization)
(ඇ) මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය
(ඈ) අධිකාරී වර්ග
(ඉ) ගැටුම් මට්ටම්
(ඊ) මග පෙන්වීම
(උ) ගැටුම් වලට හේතු

(ලකුණු 5 බැගින්)

***** ප්‍රකාශන හිමිකම් ඇවිරිණි*****